සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**8 ශ්‍රේණිය** | **විද්‍යාව** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

### I කොටස

- පළමු කොටස සඳහා මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 02 බැගින් හිමි වේ.
- දෙවන කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර එයට ලකුණු 16 ක් ලැබේ. ඉතිරි ප්‍රශ්නවලින් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න. ඒවාට ලකුණු 11 බැගින් ලැබේ.

01. වෛරස මගින් බෝ වන රෝගයක් නො වන්නේ,
(1) ක්ෂය රෝගය (2) ඒඩ්ස් (3) ඉබෝලා (4) කොරෝනා

02. කොපර් සල්ෆේට් සෑදී ඇති මූලද්‍රව්‍ය වන්නේ,
(1) කොපර්, නයිට්‍රජන්, ඔක්සිජන් (2) සල්ෆර්, කොපර්, මැග්නීසියම්
(3) ඔක්සිජන්, සල්ෆර්, කොපර් (4) පොස්පරස්, කොපර්, සල්ෆර්

03. වායු ගෝලයේ ජල වාෂ්ප අවශෝෂනය සඳහා හැඩගැසුනු ශාකයකට උදාහරණයකි,
(1) ඇන්තූරියම් (2) ඕකිඩ් (3) කිරළ (4) බේදුරු

04. ද්‍රව වශයෙන් හමුවන විදුලිය සන්නයනය කරනු ලබන ලෝහය වන්නේ,
(1) සෝඩියම් (2) කැල්සියම් (3) කොපර් (4) රසදිය

05. ස්වාභාවිකව ඇති නොවන ශබ්දයක් සඳහා නිදසුනක් වන්නේ,
(1) මුහුදු රළ මඟින් නැගෙන ශබ්දය (2) ගසක් ඇතිල්ලෙන ශබ්දය
(3) පන්සලේ ඝණ්ඨාර හඬ (4) අකුණු හඬ

06. මිනිස් සිරුරේ නිපදවන බහිස්‍රාවී ද්‍රව්‍යයක් සඳහා නිදසුනක් නොවන්නේ,
(1) යූරියා (2) මළපහ (3) මූත්‍රා (4) කාබන්ඩයොක්සයිඩ්

07. පදාර්ථය සතු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A. නිශ්චිත පරිමාවක් ඇත. B. නිශ්චිත හැඩයක් නැත.
C. පහසුවෙන් සම්පීඩනය කළ හැක.
ඉහත ලක්ෂණ අතුරින් වායු සතු ලක්ෂණ වන්නේ,
(1) A, B පමණි. (2) B, C පමණි. (3) A, C පමණි. (4) A, B, C සියල්ල ම.

08. ගිල්ලුම් තාපකය (හීටරය) භාවිතයෙන් අපට ලැබෙනුයේ විද්‍යුත් ධාරාවේ කුමන ඵලයක් ද?
(1) චුම්භක ඵලය (2) ප්‍රකාශ ඵලය (3) රසායනික ඵලය (4) තාපන ඵලය

09. මුලින් ම පදාර්ථයේ අසන්තතික බව ප්‍රකාශ කරන ලද්දේ,
(1) ඩිමොක්‍රිටීස් ය. (2) ඇරිස්ටෝටල් ය. (3) ඇරිස්ටාකස් ය. (4) ලූක්‍රේෂස් ය.

10. ස්ථිර චුම්භක භාවිත කරන අවස්ථාවක් නොවන්නේ,
(1) විදුලි සීනුව (2) මාලිමාව (3) මෝටරය (4) ස්පීකරය

11. වායව කඳේ ආහාර තැම්පත් කර ඇති ශාකයකි,
(1) කෙසෙල් (2) අර්ථාපල් (3) කිතුල් (4) කැරට්

12. ද්‍රව්‍යක ඝනත්වය සම්බන්දයෙන් ඉදිරිපත් කළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ,
A. සංශුද්ධ ද්‍රව්‍ය සඳහා ඝනත්වය නිශ්චිත අගයකි.
B. යම් ද්‍රව්‍යක ඒකක පරිමාවක ස්කන්ධය ඝනත්වය වේ.
C. යම් ද්‍රව්‍යයක් සඳහා අනන්‍ය නොවන ගුණයකි.
ඉහත ප්‍රකාශවලින් නිවැරදි වන්නේ,
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A, B පමණි.

13. මිනිසාගේ මධ්‍ය ස්නායු පද්ධතියට අයත් ප්‍රධාන කොටස් දෙක වනුයේ,
(1) මොළය හා සුසුම්නාව පමණි.
(2) මොළය හා පර්යන්ත ස්නායු පද්ධතිය පමණි.
(3) මොළය හා අනුමස්තිෂ්කය පමණි.
(4) සුසුම්නා ස්නායු පමණි.

14. පදාර්ථ පමණක් අන්තර්ගත පිළිතුර තෝරන්න.
(1) ධූවිලි, ධ්වනිය, ජලය (2) ධූවිලි, වාතය, ජලය
(3) ජලය, තාපය, වාතය (4) ජලය, දූවිලි, ආලෝකය

15. සංශුද්ධ ද්‍රව්‍යයක් තෝරන්න.
(1) කොළ කැඳ (2) ලුණු ද්‍රාවණය (3) කොපර්සල්ෆේට් ද්‍රාවණය (4) රසදිය

16. ජලයේ වෙනත් ද්‍රව්‍යයක් දිය වී ඇති විට එහි තාපාංකය,
(1) සෙල්සියස් 100 ට අඩු හෝ වැඩි විය හැක.
(2) සෙල්සියස් 100 ය වේ.
(3) සෙල්සියස් 100 ට අඩුය.
(4) සෙල්සියස් 100 ට වැඩිය.

17. බේකරි කර්මාන්තයට වැදගත්වන ක්ෂුද්‍ර ජීවී ආකාරයකි,
(1) ඇල්ගේ (2) බැක්ටීරියා (3) වෛරස (4) දිලීර

18. කුඩැල්ලා අයත්වන සත්ව බාණ්ඩය වන්නේ,
(1) මොලුස්කා (2) නිඩාරියා (3) ආත්‍රපෝඩා (4) ඇනලීඩා

19. උත්ස්වේදනය වළක්වා ගැනීමට පත්‍ර සිහින් වී ඇති ශාකයකි,
(1) පතොක් (2) කස (3) නවහන්දි (4) කනේරු

20. රසායනික විපර්යාසයක් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) අයිස් ද්‍රව බවට පත් වීම. (2) හුමාලය ඝණීභවනය වීම.
(3) දර දහනය. (4) ඝන ඉටි ද්‍රව.

- මෙම කොටසට පිළිතුරු සැපයීම සඳහා වෙනම කඩදාසියක් භාවිතා කරන්න.
- පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන් පිළිතුරු සපයන්න.
- ඉතිරි ප්‍රශ්න 05 න් ඔබ කැමති ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.

01. (A) පරිසරයේ දී හමුවන ශාක විවිධ ලක්ෂණ අනුව විවිධත්වයක් දරයි. පහත දී ඇති ශාක කොටස් භාවිත කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


කැරට්


ගොටුකොළ


රම්පේ


පතොක්


ඕකිඩ්


කරපිංචා


ලූණු

ඉහත රූපවලින් පහත ලක්ෂණ දරන ශාක තෝරා ලියන්න.

(i) ප්‍රභා සංස්ලේෂී කඳක් දරණුයේ කුමන ශාකයේ ද? (ලකුණු 01)

(ii) රම්පේ ශාකයේ ඇති විශේෂිත මුල්වර්ගයේ නම ලියන්න. (ලකුණු 01)

(iii) එම මුල් වර්ගයම ඇති ඉහත රූපවල නොමැති වෙනත් ශාකයක් ලියන්න. (ලකුණු 01)

(iv) ළූණු භූගත කඳක්වන අතර භූගත කඳන්වල කෘත්‍යන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(v) කරපිංචා, ඕකිඩ් හා ගොටුකොල යන ශාක අතුරින් ප්‍රචාණ කෘත්‍ය සඳහා දායකවන මුල් වර්ගයක් දරණ ශාකය වනුයේ ? (ලකුණු 01)

(B) පහත දී ඇති රූප සටහන් ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


ක්ලැමිඩොමොනාස්


පැරමේසියුම්


ඇමීබා


මියුකර්

(i) රෝග ඇතිකරන ක්ෂුද්‍ර ජීවියෙකු ඉහත නම්වලින් තෝරා ලියන්න. (ලකුණු 01)

(ii) රූප සටහන්වල ඇතුළත් ව ඇති සියළු ම ප්‍රොටෝසෝවාවුන් නම් කරන්න. (ලකුණු 02)

(iii) ක්ලැමිඩොමොනාස් අයත්වන ක්ෂුද්‍ර ජවී කාණ්ඩය කුමක් ද? (ලකුණු 01)

(iv) මියුකර් ක්ෂුද්‍ර ජීවියා පාන් මත ක්‍රියාකාරීත්වය හැඳින්වෙන්නේ කවර ලෙසින් ද? (ලකුණු 01)

(C) පරිසරයේ හමුවන සත්ත්ව බාණ්ඩ කීපයක ලක්ෂණ පහත දැක්වේ.

- ⋆ අරීය සමමිතියක් ඇත.
- ⋆ පේශීමය පාද දරයි.
- ⋆ කොරළ සහිත වියළි සමක් ඇත.
- ⋆ දේහය කොරපොතු වලින් ආවරණය වී ඇත.
- ⋆ භාහිර කන් පෙති සහිතය.
- ⋆ ශ්වසනය සඳහා පෙනැහැලි, මුඛය හා තෙත සම භාවිත කරයි.

ඉහත දක්වා ඇති ලක්ෂණ උපයෝගී කරගනිමින් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) අරීය සමමිතිය දක්වන සත්ව කාණ්ඩය නම් කරන්න. (ලකුණු 01)

(ii) භාහිර කන්පෙති දක්නට ඇති සත්ව කාණ්ඩය සතුව ඇති වෙනත් ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) රූපාන්තරනයක් පෙන්වන සත්ත්ව කාණ්ඩය සතු මෙහි සඳහන් ලක්ෂණ ලියන්න. (ලකුණු 01)

(iv) පේශීමය පාදය දරණ සත්ව කාණ්ඩය සඳහා උදාහරණ සත්වයෙකු ලියන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 16)

02. (A) මිනිස් සිරුරේ තිබෙන විශාලත ම ඉන්ද්‍රිය ලෙස සළකනුයේ සමයි. එහි රූප සටහනක් පහත දැක්වේ.




**මිනිසාගේ සමෙහි ව්‍යුහය**

(i) රූපයේ දැක්වෙන කොටස් නම් කරන්න. (ලකුණු 03)

(ii) සම බහිස්‍රාවී අවයවයක් ලෙස හැරුණු කොට එහි වෙනත් කෘත්‍යයන් 02 ක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

(iii) සමේ ආරක්ෂාවට ඔබ සිදු කරන්නා වූ ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න. (ලකුණු 01)

(iv) සම හැරුණු විට බහිස්‍රාවී ඉන්ද්‍රියන් දෙකක් ඇත. එම ඉන්ද්‍රියන් දෙක කුමක් ද? (ලකුණු 02)

(B) මානව ස්නායු පද්ධතියේ පහත දැක්වෙන ව්‍යුහයන්වල වැදගත්කම / කෘත්‍යය බැගින් ලියා දක්වන්න.

(i) අනුමස්තිෂ්කය (ලකුණු 01)

(ii) මෙනන්ජි පටලය (ලකුණු 01)

(iii) මස්තිෂ්ක සුෂුම්නා තරලය (ලකුණු 01)

(මුළු ලකුණු 11)

03. එදිනෙදා ජීවිතයේ දී විවිධ කාර්යයන් සඳහා චුම්භක භාවිත වේ. සමහර ලෝහ චුම්භක වෙත ආකර්ෂණය වන අතර චුම්භක වෙත ආකර්ෂණය නොවන ලෝහ ද ඇත.

(i) පහත ද්‍රව්‍ය අතුරින් චුම්භක වෙත ආකර්ෂණය වන හා නොවන වශයෙන් වර්ග කරන්න.

යකඩ, රන්, ඇලුමිනියම්,ක්‍රෝමියම්, වානේ, තඹ (ලකුණු $\frac{1}{2} \times 6 = 3$)

(ii) චුම්භක වෙත ආකර්ෂණය වන ද්‍රව්‍ය හඳුන්වන නම කුමක් ද? (ලකුණු 01)

(iii) චුම්භකයක බලය රඳා පවතින ප්‍රදේශය හඳුන්වන නම කුමක් ද? (ලකුණු 01)

(iv) සජාතීය ධ්‍රැව දෙකක් අතර යකඩ කුඩු යෙදූ විට යකඩ කුඩුවල සකස්වීම සිදුවන ආකාරය ඇඳ දක්වන්න. (ලකුණු 03)

(v) චුම්භක නිර්මාණය කර ගන්නා ක්‍රම දෙක මොනවා ද? (ලකුණු 02)

(vi) චුම්භක ගුණවලට හානි සිදුවිය හැකි ආකාරයක් නම් කරන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 11)

04. (A) පදාර්ථයේ විපර්යාස සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇති පහත සටහන ඇසුරින් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) අයඩීන් ස්ඵටික රත් කිරීමේ දී සිදුවන අවස්ථා විපර්යාසය කවර නමකින් හැඳින්වේ ද? (ලකුණු 01)

(ii) ද්‍රව්‍යයක් ඝන බවට පරිවර්තනය වීම හඳුන්වන නම කුමක් ද? (ලකුණු 01)

(iii) වායුවක් ද්‍රව්‍යයක් බවට පරිවර්තනය වන ක්‍රියාවලිය හඳුන්වන නම කුමක් ද? (ලකුණු 01)

(B) ඉන්ධනයක් දහනයේ දී නිපදවන ඵල හඳුනා ගැනීමට සිදුකරනු ලබන ක්‍රියාකාරකමක ඇටවුමක් පහත රූප සටහනෙහි දැක්වේ.




(i) මෙම ක්‍රියාකාරකමෙන් හඳුනා ගැනීමට බලාපොරොත්තු වන මූලද්‍රව්‍ය දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ඉහත ක්‍රියාකාරකමෙහි අපේක්ෂිත නිරීක්ෂණ දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

(iii) දහනය කිරීමෙන් තාප ශක්තිය හා ආලෝක ශක්තිය ලබාගැනීමට භාවිත කරන ද්‍රව්‍ය ඉන්ධන නම් වේ.

(a) ඉන්ධන බෙදිය හැකි ආකාර කීය ද? (ලකුණු 01)

(b) ඒ මොනවා ද? (ලකුණු 03)

(මුළු ලකුණු 11)

05. පදාර්ථය සතු භෞතික ගුණ අතුරින් විද්‍යුත් සන්නායකතාවය පරීක්ෂා කිරීමට අවශ්‍යවන උපකරණ හා ද්‍රව්‍ය පහත දක්වා ඇත.




වෝල්ට්මීටරය




ඇමීටරය




වියළි කෝෂය



බල්බය



ස්විච්ය



සම්බන්ධක කම්බි

(i) ඉහත උපකරණ හා ද්‍රව්‍ය සඳහා විද්‍යාවේ දී භාවිත කරන සංකේත ඇඳ දක්වන්න. (ලකුණු 03)

(ii) බල්බය තුලින් ගලන ධාරාව හා එහි විභව අන්තරය සොයා ගැනීම සඳහා සංකේත භාවිතයෙන් පරිපථ සටහනක් අඳින්න. (ලකුණු 03)

(iii) ඉහත පරිපථයේ ඇමීටරය හා වෝල්ට් මීටරය පරිපථය හා සම්බන්ධ කෙරෙන ක්‍රම දෙක නම් කරන්න. (ලකුණු 02)

(iv) පරිපථය භාවිත කර ඔබට සපයා ඇති ද්‍රව්‍ය සන්නායක හා පරිවාරක වශයෙන් වෙන් කරන්න.

යකඩ ඇණයක්, වියලි ලී කැබැල්ලක්, කාබන් කූරක්, ප්ලාස්ටික් රූලක් (ලකුණු 02)

(v) පරිපථය ක්‍රියාත්මක වීමේ දී බල්බයෙන් ලැබෙන ආලෝක ඵලයට අමතරව ලැබෙන වෙනත් ඵලයක් සඳහන් කරන්න. (ලකුණු 01)

(මුළු ලකුණු 11)

06. පහත රූප සටහනේ දැක්වෙන්නෙ විද්‍යාගාරයේ දී ඔබ විසින් නිර්මාණය කරගන්නා ලද සයිලපෝනයක රූප සටහනකි. එය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) ඉහත නිර්මාණය සිදු කිරීමට ඔබ විසින් භාවිත කරන ලද ද්‍රව්‍ය 02ක් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) මෙහි ධ්වනිය නිපදවන්නේ කුමක් කම්පනය මගින් ද? (ලකුණු 01)

(iii) එයින් නිර්මාණය වන ධ්වනි තරංගවල සංඛ්‍යාතය වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 02)

(iv) සංගීත නාදයක් හා ඝෝෂාවක් අතර වෙනස ලියන්න. (ලකුණු 02)

(v) සංගීත චිකිත්සාව යනු කුමක් ද? (ලකුණු 01)

(vi) සංගීත චිකිත්සාව මගින් සුවකල හැකි රෝගී තත්වයක් දෙකක් ලියාදක්වන්න. (ලකුණු 02)

(vii) මිනිසාගේ ශ්‍රව්‍යතා පරාසය කොපමණ ද? (ලකුණු 01)

(මුළු ලකුණු 11)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (1) | 02. (3) | 03. (2) | 04. (4) | 05. (3) | 06. (2) | 07. (2) | 08. (4) | 09. (1) | 10. (1) |
| 11. (3) | 12. (4) | 13. (1) | 14. (2) | 15. (4) | 16. (1) | 17. (4) | 18. (4) | 19. (2) | 20. (3) |

එක් නිවැරදි පිළිතුරකට ලකුණ2 බැගින් ලකුණු 40 යි

## II කොටස

01. (A) (i) පතොක් (ලකුණු 01)
(ii) කයිරුමුල් (ලකුණු 01)
(iii) වැටකෙයියා (ලකුණු 01)
(iv) කාල තරණය, ශාක බිහිකිරීම, ආහාර තැම්පත් කිරීම. (ලකුණු 02)
(v) කරපිංචා (ලකුණු 01)
(B) (i) ඇමීබා (ලකුණු 01)
(ii) පැරමේසියම්, ඇමීබා (ලකුණු 02)
(iii) ඇල්ගේ (ලකුණු 01)
(iv) පැසීම (ලකුණු 01)
(C) (i) නිඩාරියා (ලකුණු 01)
(ii) ක්ෂීරපායීන්ගේ ලක්ෂණ දෙකකට (ලකුණු 02)
(iii) ශ්වසනය සඳහා පෙනැහැලි, මුඛය හා තෙත සම භාවිත කිරීම. (ලකුණු 01)
(iv) නිවැරදි පිළිතුරකට (ලකුණු 01)
(මුළු ලකුණු 16)

02. (A) (i) a චර්මය b රෝම c අපිචර්මය (ලකුණු 03)
(ii) නිවැරදි පිළිතුරකට (ලකුණු 02)
(iii) නිවැරදි පිළිතුරකට (ලකුණු 01)
(iv) පෙනැහැලි හා වකුගඩු (ලකුණු 02)
(B) (i) දේහය සමතුලිත කිරීම. (ලකුණු 01)
(ii) මොළය හා සුෂුම්නාව ආරක්ෂා කිරීම (ලකුණු 01)
(iii) කම්පනවලින් ආරක්ෂා කිරීම. (ලකුණු 01)
(මුළු ලකුණු 11)

03. (i) ආකර්ෂණය වන - යකඩ, වානේ, ක්‍රෝමියම්
ආකර්සණය නොවන - රන්, ඇලුමිනියම්, තඹ (ලකුණු $\frac{1}{2} \times 6 = 03$)
(ii) චුම්භක ද්‍රව්‍ය (ලකුණු 01) (iii) චුම්භක ක්ෂේත්‍රය (ලකුණු 01)
(iv) නිවැරදි පිළිතුරට (ලකුණු 03)



(v) විද්‍යුත් ක්‍රමය, ස්පර්ෂ ක්‍රමය (ලකුණු 02)
(vi) නිවැරදි පිළිතුරකට (ලකුණු 01)

04. (a) (i) ඌර්ධවපාතනය (ලකුණු 01)
(ii) ශිමායනය (ලකුණු 01)
(iii) ඝනීභවනය (ලකුණු 01)
(B) (i) C හා H (ලකුණු 02)
(ii) H ඇතිනම් සුදු පැහැති $CuSO_4$ නිල් පැහැවේ.
C ඇත්නම් අවර්ණ හුණුදියර කිරි පැහැවේ. (ලකුණු 02)
(iii) a. 3 (ලකුණු 01)
b. ඝන ඉන්ධන, ද්‍රව ඉන්ධන, වායු ඉන්ධන (ලකුණු 03)
(ලකුණු 11)

05. (i)




(ලකුණු ½ × 6 = 03)

(ii)




(ලකුණු 03)

(iii) ඇමීටරය - ශ්‍රේණිගතව, වෝල්ට් මීටරය - සමාන්තරගතව (ලකුණු 02)

(iv)

| සන්නායක | පරිවාරක |
|---|---|
| යකඩ ඇණ | වියළි ලී |
| කාබන් කූර | ප්ලාස්ටික් රූල |

(ලකුණු ½ × 4 = 02)

(v) තාපන එලය (ලකුණු 01)

(මුළු ලකුණු 11)

06. (i) තහඩු හා වෙනත් ද්‍රව්‍යයන් සඳහා (ලකුණු 02)

(ii) තහඩු කම්පනය වීමෙන් (ලකුණු 01)

(iii) තහඩු දිග වැඩිවන විට කම්පන සංඛ්‍යාතය අඩුවන අතර තහඩු දිග අඩු වේ නම් කම්පක සංඛ්‍යාතය වැඩි වේ. (ලකුණු 02)

(iv) රිද්මයානුකූල ලෙස ගැයෙන හෝ වැයෙන සංගීත නාද වන අතර එසේ නොවන අක්‍රමවත් ලෙස වැයෙන හෝ ගැයෙන ශබ්ද ඝෝෂා නම් වේ. (ලකුණු 02)

(v) සංගීතය භාවිතයෙන් රෝග සඳහා ප්‍රතිකාර කිරීමේ ක්‍රමවේදය (ලකුණු 01)

(vi) හෘදයාබාධ, මානසික අවපීඩනය (ලකුණු 01)

(vii) 20Hz - 20000Hz (ලකුණු 02)

(මුළුලකුණු 11)